# පහතරට සිතුවම් ආශ්‍රිතව දක්නට ලැබෙන හස්තියා

**ඒ.කේ. රංගිකා මධුමාලි ***

ශ්‍රී ලංකාව වූ කලී විශිෂ්ට සිතුවම් කලා සම්ප්‍රදායකට උරුමකම් කියන රටක් බවට පවතින සාහිත්‍යගත මූලාශ්‍රමය තොරතුරුවලින් මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ගෙන් ද මැනවින් සනාථ වේ. මානව ආකල්ප හුවමාරු කරගනු ලබූ දෘශ්‍ය මාධ්‍යක් වශයෙන් අපට සිතුවම් කලාව හැඳින්විය හැකිය. මෙම පර්යේෂණ පත්‍රිකාවේ ප්‍රධාන අරමුණ වන්නේ, පහතරට සිතුවම් ආශ්‍රිතව දක්නට ලැබෙන හස්තියා පිළිබඳ අධ්‍යයනයි. ඒ අනුව මෙහි අධ්‍යයන ප්‍රදේශය ලෙස පහතරට ප්‍රදේශයේ ස්ථාන කිහිපයක් මූලික කරගෙන ඒ ආශ්‍රිත විහාරාරාමවල සිතුවම් අධ්‍යයනය කරනු ලැබීය. මෙහිදී පහතරට සිතුවම් කලාව පිළිබඳත්, එම සිතුවම් ඇඳි සිත්තර පරම්පරාවන් පිළිබඳත් අධ්‍යයනය කරනු ලැබීය. මෙම පර්යෙෂණ පත්‍රිකාවට මූලික කරගන්නා විහාරස්ථාන පහතරට ප්‍රදේශයේ දිස්ත්‍රික්ක කිහිපයක් ආශ්‍රයෙන් තෝරාගනු ලැබීය. මෙහිදී එක් එක් විහාරවල සිතුවම් ආශ්‍රිත හස්තියා දක්නට ලැබෙන අවස්ථා මෙන්ම එම හස්තින්ගේ ස්වරූපය මෙහිදී අධ්‍යයනය කරනු ලැබීය. පහතරට සිත්තර පරම්පරාවන් ප්‍රාදේශීය සම්ප්‍රදායන් උරුම කරගත් සිත්තම් කලාවක් නිර්මාණය කළ පිරිසක් වන අතර සමකාලීන අංග සිතුවම් අතර දැක්වීමට ඔවුන් කටයුතු කර ඇති බව දැකිය හැකි ය. හස්තියාව අලංකරණය සඳහා යොදාගත් අංග ද මෙහිදී විශේෂ වේ. අනෙකුත් සිතුවම්වලට වඩා පහතරට සිතුවම්වල ස්වභාවිකත්වය නැතහොත් තාත්වික ස්වරූපය ඉස්මතු කිරීමට බොහෝවිට කටයුතු කර ඇති බව සිතුවම් අධ්‍යයනයේ දී පැහැදිලි වේ. මෙම සිතුවම්වල හස්තියා ද නිරූපණය කිරීමේ දී අනෙකුත් රූපවල ප්‍රමාණ සමඟ යම් අසමතුලිත බවක් දක්නට ලැබුණ ද ස්වභාවික ඉරියව්වලින් හස්තියා නිරූපණය කර දැක්වීම සුවිශේෂ ලක්ෂණයක් වේ. බොහෝවිට මෙම සිතුවම්වල හස්තියා නිරූපණය කර ඇත්තේ ජාතක කථා හා බුදු සිරිතේ සිදුවීම් ආශ්‍රිත යම් යම් අවස්ථා සම්බන්ධ සිද්ධි නිරූපණය කිරීමටය. බොහෝවිට මෙම හස්තියාගේ පිටේ ප්‍රභූවරයෙකු හිඳගෙන සිටින අවස්ථාවක් හෝ ධාතු වඩම්මවා ඇති අවස්ථා දක්වා ඇත. අලංකාර වස්ත්‍රාභරණ හා විවිධ රටා එකතු කරමින් මෙම හස්තියා අලංකාර අයුරින් නිරූපණය කිරීමට පහතරට සිත්තරා කටයුතු කර ඇති බව දක්නට ලැබේ. එමෙන්ම ඇතැම් අවස්ථාවල මංගල හස්තිගාල නිරූපණය කරන අවස්ථාවන් හා පෙරහැර නිරූපණය කිරීමට ද හස්තියා සිතුවම් කර ඇත. මෙම කරුණු සනාථ කිරීමට කේවල අධ්‍යයනයක් මගින් පාදක කරගත් පර්යේෂණ දත්ත උපයෝගී කර ගනිමින් ඒවා විශ්ලේෂණ කර පැහැදිලි කිරීමට බලාපොරොත්තු වේ.

**මුඛ්‍ය පද - හස්තියා, පහතරට සිතුවම්, ජාතක කථා**

---

*** සහකාර කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.**